හයිලෙවල් මාර්ගයේ පහත්ගම රාජසිංහ මාවත අසල පෙබ. 02, 2023 දින සිදුවූ රිය අනතුරක් සම්බන්ධයෙන්, දිනමිණ පුවත්පත ( පෙබ. 03, 2023) වාර්තා කර තිබුණේ මෙසේයි.
සිරස්තලය: "ඩ්‍රැයිවර් නෝනාගේ කාරය ටෙලිපෝන් කණුවක් සිප ගනී"
පුවත් අන්තර්ගතය: දරු දෙදෙනාද සමඟ රිය පදවාගෙන ආ කාන්තාවක් දුරකථන රැහැන් කණුවක ගැටී මෙම අනතුර සිදුව ඇති බව වාර්තා කරයි.
ඔබ සිතන ලෙසට,
1) කාන්තාවක නොව, පුරුෂයෙකු සම්බන්ධ වූ රිය අනතුරක දී පවා, මෙම පුවතේ ආකාරයට රිය පදවා ගෙන ආ අයගේ ස්ත්‍රී පුරුෂ භාවය විශේෂ කොට දැක්වෙන්නේ ද?
2) එසේ පුරුෂයෙකු සම්බන්ධ රිය අනතුරකදී ස්ත්‍රී පුරුෂ භාවය විශේෂයෙන් ඉස්මතු කොට නොදැක්වෙන්නේ නම්, මෙම පුවතෙහි දී, "ඩ්‍රැයිවර් නෝනා" යනුවෙන් අනතුරට ලක් වූ රිය පදවා ගෙන ආ අය කාන්තාවක් බව ඉස්මතු කොට දක්වන්නේ මන්ද?
3) කාන්තාවන් රිය පැදවීම සම්බන්ධයෙන් විවිධ ඒකාකෘතික කිරීම් (stereotypes) තවමත් අප සමාජය තුළ පවතින පසුබිමක, මෙම අනතුරට ලක් වූ රිය "කාන්තාවක්" විසින් පැදවූ බව විශේෂයෙන් ඉස්මතු කොට දැක්වීම අවශ්‍ය වේද?
4) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් යැයි ඔබ නොසිතන්නේ ද?
Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න. ඔබට අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් ඒ සඳහා භාවිතා කළ හැක.

